ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ සහනික පත්‍ර වැඩසටහන
දෙවන මට්ටම
අවසාන පරීක්ෂණය 2018
ගිණුම්කරණය හා මූල්‍ය හැඳින්වීම - MCC1206
කාලය පැය දෙකයි (02)

දිනය: 2018.10.27	වේලාව: ප.ව. 01.30 සිට ප.ව.3.30 දක්වා

<u>උපදෙස්</u>
පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්වන්න. වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

ප්‍රශ්න අංක (01) (අනිවාර්ය ප්‍රශ්නය)

දම්මික සිල්වා මහතා සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. පහත සඳහන් ශේෂ පිරික්සුම 2018.03.31 දිනට දම්මික ට්‍රේඩර්ස් හි පොත් වලින් උපුටා ගන්නා ලදි.

(වටිනාකම් රුපියල් වලිනි.)

විස්තරය	හර.	බැර.
ප්‍රාග්ධනය		1,500,000
ඉඩම (පිරිවැයට)	1,280,000	
මෝටර් වාහන (පිරිවැයට)	650,000	
උපකරණ (පිරිවැයට)	420,000	
ක්ෂය වෙන් කිරීම්		
මෝටර් වාහන		280,000
උපකරණ		150,000
විකුණුම්		1,500,000
2017.04.01 දිනට තොගය	180,000	
ගැණුම්	740,000	
ගෙන ඒමේ කුලී	12,000	
පරිපාලන වියදම්	90,000	
වේතන	190,000	
බොල් ණය	4,300	
රක්ෂණය	11,500	
ණය ගැනියෝ සහ ණය හිමියෝ	95,000	146,000
2017.04.01 දිනට අඩමාන ණය වෙන් කිරීම		12,000
ලද වට්ටම්		10,000
කැපැල් ගාස්තු	16,000	
අලෙවිකරණ වියදම්	20,000	
බැංකු ණය -12%		250,000
ගෙන යාමේ කුලී	3,200	
විකුණුම් වියදම්	40,000	
බැංකු ණය නැවත ගෙවීම්	60,000	
අකැනි මුදල් සහ බැංකු මුදල්	36,000	
එකතුව	3,848,000	3,848,000

අමතර කොරතුරු

i. 2018.03.31 දිනට අවසාන තොගය රු.90,000/- ක් ලෙස තක්සේරු කොට ඇත.
2018.03.31 වන දිනට ගෙවිය යුතු රක්ෂණ වාරික රු.8,500/- ක් සහ ඉදිරියට කරන ලද අලෙවිකරණ වියදම්රු5,000 /- ක් ලෙස සැලකිය යුතුය.

ii. වර්ෂය සඳහා ස්ථාවර වත්කම් 2017/2018 වර්ෂය සඳහා තවම ක්ෂය කර නොමැත.
ස්ථාවර වත්කම් ක්ෂය අනුපාත
උපකරණ - 05%
මෝටර් රථ - 10%

iii. 2018.03.31 දිනට අඩමාණ ණය ප්‍රතිපාදනය 10% ක් විය යුතුය.

iv. බැංකු ණය 2017.07.01 දින වර්ෂ 05ක් සඳහා සමපත් බැංකුවෙන් ලබා ගෙන තිබුණි.

ඉහත කොරතුරු ආශ්‍රයෙන් 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දම්මික ට්‍රේඩර්ස් හි ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න.

(මුළු ලකුණු 40)

ප්‍රශ්න අංක (02)

I. ගනුදෙනු හඳුනාගැනීම සඳහා ගිණුම්කරණයේදී භාවිතා කරන ප්‍රභව ලියකියවිලි දෙකක් (02) දක්වන්න. (ලකුණු 02)

II. මූලික පොතක් යනු කුමක්ද? ගිණුම්කරණයේ දී එන මූලික පොත් දෙකක් (02) දක්වන්න. (ලකුණු 03)

III. පහත සඳහන් ගණුදෙනු දෙක ගිණුම්කරණ සම්කරණය මත වාර්තා කරන්න.
a. රු.35,000/- ක බැංකු ණය වාරිකයක් චෙක්පතකින් ගෙවන ලද අතර ඉන් රු.17,500/- ක් පොළිය වෙයි.
b. අයිතිකරු විසින් තම පෞද්ගලික මුදල් වලින් රු. 10,000/- ව්‍යාපාරයේ සැපයුම් කරුවෙකුට ගෙවන ලදි. (ලකුණු 02)

IV. ශේෂ පිරික්සුම සමාන නොවීමට බලපාන අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

V. පහත සඳහන් ගිණුම්කරන වැරදි දෙක නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් ලියන්න
a. ණය හිමියෙකුට චෙක්පතකින් ගෙවන ලද රු.25,125 ක මුදල, ණය ගැති ගිණුමට බැර කොට තිබේ.
b. ලද වට්ටම් රු,10,000/- ක මුදල දුන් වට්ටම් ලෙස හඳුනාගෙන ඇත. (ලකුණු 04)

VI. ඔබ, ගිණුම්කරණයේදී වත්කමක්, වගකීමකින් වෙන් කොට දක්වන්නේ කෙසේද? (ලකුණු 04)

VII. පහත සඳහන් ගිණුම් ව්‍යාපාරයක ශේෂ පිරික්සුමකින් උපුටා ගන්නා ලදි.

i.	ගොඩනැගිලි	vi	බොල් ණය
ii.	විකුණුම්	vii	යන්ත්‍ර සහ උපකරණ
iii.	අයිතිකරුගේ ප්‍රාග්ධනය	viii	වෙළඳ ණය හිමියෝ
iv.	ගෙවූ වේතන	ix	ලද වට්ටම්
v.	බැංකු ණය	x	ණය පොළිය

අවශ්‍ය වන්නේ:

i. ඉහත ගිණුම් වලින් කුමන ගිණුම්, වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් සහ වියදම් ලෙස වර්ගීකරණය කරන්නේද යන්න දක්වන්න. (ලකුණු 09)

ii. ආදායම් ප්‍රකාශනයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් කරන ගිණුම් කවරේ දැයි දක්වන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 30)

ප්‍රශ්න අංක (03)

දඹුලු ලීබඩු ආයතනය සුළු පරිමාණයේ ලීබඩු නිෂ්පාදකයෙකු වන අතර ඔවුන් මෑතකදී සිහිනි පෙර පාසලෙන් පුටු 1000 නිපදවීමට ඇණවුමක් භාර ගන්නා ලදී. පහත සඳහන් වන්නේ එම ඇණවුමට අදාල තොරතුරුය.

	වටිනාකම් (රු)
2018.06.01 දිනට ආරම්භක තොගය (දැව)	33,000
ඇණවුමට අදාල විශේෂිත වියදම්	
මිලදී ගත් දැව	827,000
මෙම ඇණවුම සඳහා ගණනය කරන ලද කුලී වියදම	15,000
කීන්ත සහ වාර්නිෂ්	280,000
සේවක වේතන	148,000
සුපරීක්ෂක ගාස්තු	35,000
විදුලිය	8,500
යන්ත්‍ර අළුත්වැඩියා	6,500
ඇණ සහ විවිධ වියදම්	12,000
මෙම ඇණවුම වෙනුවෙන් ගණනය කරන ලද යන්ත්‍ර ක්ෂය	8,000
2018.07.31 දිනට අවසන් තොගය (දැව)	45,000

ඔබ විසින් ඉහත තොරතුරු ආශ්‍රයෙන් පහත දෑ ගණනය කරන්න.

i. ප්‍රාථමික පිරිවැය
ii. පොදු කාර්ය පිරිවැය
iii. මුළු පිරිවැය
iv. පුටුවක පිරිවැය

(මුළු ලකුණු 30)

ප්‍රශ්න අංක (04)

I. අයවැය ලේඛනයක් යනු කුමක්ද? අයවැය ලේඛනයකින් ව්‍යාපාර ආයතනයකට ඇති වාසි පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 10)

II. සුවඳ සබන් නිෂ්පාදකයකු නිපදවන සබන් කැටයක් රුපියල් 50/- ක් ලෙස මිල කර ඇත. නිෂ්පාදනයට අදාල පිරිවැය පහත පරිදි වේ.

	පිරිවැය/ වටිනාකම (රු)
සෘජු ද්‍රව්‍ය ඒකකයක මිල	15/-
සෘජු ශ්‍රමය	10/-
සෘජු අනෙකුත්	05/-
ස්ථාවර නිෂ්පාදන පිරිවැය	3,000,000/-
අපේක්ෂිත අලෙවි ඒකක ප්‍රමාණය 225,000	

(a) ඒකකයක දායකය ගණනය කරන්න (ලකුණු 03)

(b) විකුණුම් දායක අනුපාතය (C/S) අනුපාතය ගණනය කරන්න (ලකුණු 02)

(c) නව භාණ්ඩයේ ලාභ සම්විඡේදක ලක්ෂයේදී අලෙවි ඒකක ගණන සහ එහි වටිනාකම ගණනය කරන්න. (ලකුණු 04)

(d) ආරක්ෂක ආන්තිකය ඒකක වලින් ගණනය කරන්න. (ලකුණු 04)

(e) සබන් කැටයක මිල රුපියල් 5කින් ඉහල ගියේ නම්, නව ලාභ සමවිඡේද ලක්ෂයේදී විකුණුම් ඒකක ගණන කොපමණද? (ලකුණු 03)

(f) මෙම නිෂ්පාදිත කාලය තුල නිෂ්පාදකයා රුපියල් 1,000,000/- ඉලක්ක ගත ලාභයක් අපේක්ෂා කරන්නේ යැයි සිතන්න. (e) හි දක්වන ලද මිල ඉහල යාමට පෙර මෙම ඉලක්ක ගත ලාභය අත්පත් කරගැනීමට කොපමණ ඒකක ගණනක් අලෙවිකල යුතුද? (ලකුණු 04)

(මුළු ලකුණු 30)

ප්‍රශ්න අංක (05)

පහත සඳහන් මාතෘකා සඳහා කෙටි සටහන් ලියන්න.

I. ගිණුම්කරණ සම්කරණය
II. ද්විත්ව තීරු මුදල් පොත
III. විකුණුම් ඉන්වොයිසිය
IV. ශේෂ පිරික්සුම
V. ගැණුම් ජ'ර්නලය
VI. අවිනිශ්චිත ගිණුම

(එකකට ලකුණු 05 බැගින්)
(මුළු ලකුණු 05 x10 = 30)

(මුළු ලකුණු 100)

- සියලුම හිමිකම් ඇවිරිණි -